# මතුගම අධ්‍යාපන කලාපය

## දෙවන වාර පරීක්ෂණය - 2019

**13 ශ්‍රේණිය** **පෙරදිග සංගීතය I පත්‍රය** කාලය පැය 02

- සියලුම ප්‍රශ්න සඳහා වඩාත් නිවැරදි පිළිතුරු තෝරන්න.

01) පෙරදිග සංගීතයට අනුව ගායකයකු ශ්‍රැතිය තෝරාගත යුත්තේ,

1. මධ්‍ය සඩ්ජය පදනම් කරගෙනය.
2. මන්ද්‍ර කෝමළ නිශාදය පදනම් කරගෙනය.
3. තමාගේ ස්වභාවික හඬ මට්ටම පදනම් කරගෙනය.
4. ගුරුවරයාගේ ශ්‍රැතිය පදනම් කරගෙනය.
5. පන්තියේ සිසුන්ගේ පොදු ශ්‍රැතිය පදනම් කරගෙනය.

02) භාව පූර්ණ ගායනයක් සඳහා,

1. ස්වර අභ්‍යාස කළ යුතුය.
2. අ කාරයෙන් ගැයීම ප්‍රගුණ කළ යුතුය.
3. ස්වර නිවැරදිව ගායනා කළ යුතුය.
4. තාම්පුරාව යොදාගත යුතුය.
5. හඬ පාලනයකින් යුතුව ගැයිය යුතුය.

03) ගායකයකු සතු ගුණාංගයක් විය නොහැක්කේ,

1. සප්තක තුනම ඇසුරු කිරීම.
2. මුඛය විවෘත කරමින් ගායනය කිරීම.
3. පිට කොන්ද සෘජුව තබා ගනිමින් ගායනය කිරීම.
4. උච්ජාරණය පැහැදිලි වීම.
5. රාග පිළිබඳව නිවැරදි දැනුමකින් යුතුව ගායනා කිරීම.

04) ඛ්‍යාල් ගීතයෙහි වචන යොදා ගනිමින් ගයන තානාලංකාර වන්නේ,

1. සර්ගම් තානාලංකාර.
2. නෝම් තෝම් තානාලංකාර.
3. අකාර් තානාලංකාර.
4. බෝල් තානාලංකාර.
5. සපට් තානාලංකාර.

05) උදය සන්ධිප්‍රකාශ රාගයක් වීම සඳහා.

1. කෝමළ රි කෝමළ ධ සමග ශුද්ධ මධ්‍යමය යෙදිය යුතුය.
2. කෝමළ රි කෝමළ ධ සමග තීව්‍ර මධ්‍යමය යෙදිය යුතුය.
3. ශුද්ධ රි ශුද්ධ ධ සමග මධ්‍යමය යෙදිය යුතුය.
4. ශුද්ධ රි ශුද්ධ ධ සමග තීව්‍ර මධ්‍යමය යෙදිය යුතුය.
5. ශුද්ධ රි හා කෝමළ ධ සමග තීව්‍ර මධ්‍යමය යෙදිය යුතුය.

6. ස ධ / ප ප ධ / ම ප / ම ග රි

1. දේශ් රාගයට අයත් සර්ගම් ගීතයයි.
2. කාලිංගඩා රාගයට අයත් සර්ගම් ගීතයයි.
3. භෛරව රාගයට අයත් මධ්‍යලය ගීතයයි.
4. භෛරව රාගයට අයත් සර්ගම් ගීතයයි.
5. දේශ් රාගයට අයත් මධ්‍යලය ගීතයයි.

7. තාල වාදනයෙන් තොරවුත් භාවමය ගුණයෙන් පොහොසත් වුත් මානසික ඒකග්‍රතාවයකින් යුතුව රාගයට ප්‍රවිශ්ටවීමට ගයනු වයනු ලබන්නේ.

1. මධ්‍යාලාපයි. 2. ආලාපයි. 3. ජලායි.
4. දොහොරාවය. 5. පල්ටාය.

8. සංධිවනි ආකෘතියට අනුව ප්‍රේමසිරි කේමදාස මහතා ගොඩනැගූ දේශීය නිර්මාණයක් වන්නේ,

1. පන්සිළු. 2. ගොයම්දා මගුල. 3. මාර පරාජය.
4. සිංහල අවුරුද්ද. 5. මහාභිනිෂ්ක්‍රමණය.

9. ජය ජය වන්ති රාගය හා නොබැඳෙන ලක්ෂණයකි.

1. රි, ප, වාදි සංවාදි ස්වර ලෙස යෙදේ.
2. පරමේල ප්‍රවේශක රාගයකි.
3. සෝරට් අංග , ගෞඩ බිලාවල් අංග සම්මිශ්‍රවේ.
4. උත්තරාංගවාදි රාගයකි.
5. ශුද්ධ , කෝමළ නිශාදයන් සහ ශුද්ධ , කෝමළ ගාන්ධාරයන් යෙදේ.

10. Great fantasia සහ Fugue in G Minor කාගේ නිර්මාණයක්ද ?

1. බාක්. 2. මෝසාර්ට්. 3. බීතෝවන්.

4. යානි. 5. වාග්නර්.

11. සැවුලා වන්නමට අයත් තාල රූපය වන්නේ,

1. සුළු මැදුම් දෙතිත. 2. මහතනි තිත. 3. සුළු මහ දෙතිත.

4. මැදුම් මහ දෙතිත. 5. මැදුම් තනි තිත.

12. "උරුට්ටුව" නම් කොටස අයත් ගීත විශේෂය කුමක් ද?

1. වන්නම්. 2. සොකරි. 3. ප්‍රශස්ති. 4. නාඩගම්. 5. නූර්ති.

13. Percussion Instruments යටතේ එන Definite Pitch ගණයට අයත් නොවන්නේ,

1. Tenor Drum. 2. Glockenspiel. 3. Timpani.

4. Vibraphone. 5. Xylophone.

14. මාතලන් චිත්‍රපටයට අයත් නොවන්නේ.

1. සිරිනි සරුසර වීලා. 2. කමලාගිණී.

3. රන්වන් දූල් කරලින්. 4. උපත ලබා මේ ලෝකේ.

5. සඳ රාහු මුඛයේහි.

15. " රේඛාව " චිත්‍රපටය හා සම්බන්ධ නොවන්නේ,

1. අධ්‍යාක්ෂණය ආචාර්ය ලෙස්ටර් ජේම්ස් පීරිස් මහතාය.

2. 1956 වර්ෂයේ තිරගත විය.

3. එස් දක්ෂිණා මූර්ති සංගීත අධ්‍යක්ෂණයෙන් දායක විය.

4. ගීත ප්‍රබන්ධය මර්සලින් ජයකොඩි පියතුමාගේ ය.

5. සිසිර සේනාරත්න ගීත ගායනයෙන් දායක විය.

16. තිලවඩා සහ ත්‍රිතාලයේ ගති ලක්ෂණය වෙනස් වීමට පාදක වී ඇත්තේ,

1. මිතිය වෙනස් නිසාය.

2. මිතිය සමාන වුවද විභාග අසමාන නිසාය.

3. ලයෙහි ඇති වෙනස්කමය.

4. මිතිය සහ විභාග අසමාන නිසාය.

5. මිතිය සහ ලය සමාන නිසාය.

17. Simple Duple Time Signature සඳහා නිදසුනකි.

1. 4 /8 2. 4/4 3. 3 / 4 4. 6/8 5. 2/4

18. “ ම ප ධ නි ස් ර් ග් ම් “ යන ආරෝහණ ස්වර ඛණ්ඩය

1. මධ්‍යය තීව්‍ර කළ විට G Major Scale වේ.
2. මධ්‍යය තීව්‍ර කළ විට G Minor Scale වේ.
3. නිෂාදය කෝමළ කළ විට F Major Scale වේ.
4. නිෂාදය කෝමළ කළ විට F Minor Scale වේ.
5. මධ්‍යය තීව්‍ර කළ විට F Minor Scale වේ.

19. මොළයේ දකුණු අර්ධ ගෝලය හා සම්බන්ධ නොවන්නේ,

1. ගණිතය. 2. කලාව. 3. නිර්මාණකරණය. 4. සංගීතය. 5. අගය කිරීම.

20. සිතාරයේ ප්‍රධාන තත විවෘතව වාදනය කළ විට හඬ නැගෙන ස්වරය වන්නේ,

1. මන්ද්‍ර පංචමය. 2. මන්ද්‍ර සඩ්ජය. 3. මන්ද්‍ර මධ්‍යමය.
4. මධ්‍ය සඩ්ජය. 5. මධ්‍ය මධ්‍යමය.

21. Musicology of India කාගේ කෘතියක් ද?

1. සාරංග දේව පඬිතුමා. 2. විෂ්ණු නාරායන් භාත්ඛණ්ඩේ පඬිතුමා.
3. මහාචාර්ය වී. එස්. නිගාම්. 4. රත්නජංකර් පඬිතුමා.
5. අමීර් ඛුෂ්රූ පඬිතුමා.

22. “ අවස්ථාවට අනුකූලව තමන් විසින් ම අනුවර්තනය වීමට හැකි පුද්ගලයාගේ ප්‍රජානනම හැකියාව බුද්ධියයි. “ මෙය කාගේ නිර්වචනයක් ද?

1. ස්පියර්මන් ගේ නිර්වචනයකි. 2. බිනේ ගේ නිර්වචනයකි.
3. ගාඩ්නර් ගේ නිර්වචනයකි. 4. ගිල්ෆර්ඩ් ගේ නිර්වචනයකි.
5. බාක් ගේ නිර්වචනයකි.

23. රාග ගාන සමය තීරණය කිරීමේ දී “ අද්ව දර්ශක “ නොහොත් “සමය දර්ශක“ ස්වරය ලෙස හැඳින්වෙන්නේ,

1. ස. 2. ග. 3. ම. 4. ධ. 5. නි.

24. මිනිස් සිරුර තුළ ශක්ති ස්ථාන (චක්‍ර) කීයක් තිබේද ?

1. 6 කි. 2. 7 කි. 3. 8 කි. 4. 9 කි. 5. 3 කි.

25. 1948 වර්ෂයේ ලංකාවට නිදහස ලැබීමෙන් පසු පැවති " පැජන්ට් ඔෆ් සිලෝන් " නම් සංගීතමය වැඩසටහනේ සංගීත නිර්මාතෘවරයා වන්නේ,

1. ආචාර්ය ලයනල් එදිරිසිංහ ශූරීන්.
2. බී. වික්ටර් පෙරේරා ශූරීන්.
3. ඩබ්. ඩී. අමරදේව ශූරීන්.
4. සී. ද. එස්. කුලතිලක මහතා.
5. සුනිල් ශාන්ත මහතා.

- ප්‍රශ්න අංක 26 සිට 50 දක්වා ප්‍රශ්න වලට නිවැරදි පිළිතුරු හිස්තැනට ලියන්න.

26. ගප නිස් ග්‍රි් ස්රි් / ස්ස් පප ගරි සරි / මෙම තානාලංකාරයෙන් පිළිඹිබු වන රාගය නම් කරන්න. ……………………………………………………………………………..

27. එම රාගයෙහි යෙදෙන වාදි ස්වරය කුමක්ද ? …………………………………………

28. එම රාගය අයත් මේලයේ ස්වර ලියා දක්වන්න. …………………………………………

29. ඉහත තානාලංකාර වර්ගය නම් කරන්න. ……………………………………………

30. ඉහත රාගයේ ගායන සමය ලියා දක්වන්න……………………………………………

31. ඉහත රාගය ආශ්‍රය කොටගත් ඔබ අසා ඇති ගීතයක් නම් කරන්න.

……………………………………………………………………………………………..

32. ආසාවරී ථාටයට සමාන බටහිර සංගීතයේ එන ස්කේලය නම් කරන්න. ……………………

33. "චුප්කේ චුප්කේ" යන ගසල් ගීතය ගැයුවේ කවුරුන්ද ?…………………………………

34. “ සංගීත රත්නාකරය“ කාගේ නිර්මාණයක් ද? ……………………………………………

35. Reggae , salsa , samba, Ramba ආදි තාල රටා කුමන සංගීතය හා සම්බන්ධ ද?

………………………………………………………………………………………..

36. දේශ් සහ භෛරව රාගයන්ගේ සම ප්‍රකෘති රාග පිළිවෙලින් ලියා දක්වන්න.

………………………………………………………………………………………..

37. පඛ්වාජයෙන් වයන ……………………………තාලය 38.) …………………………
ගීත ශෛලියේදි භාවිත කෙරේ.

39. ජාවා හා සුමාත්‍රා දූපත් වල බිහි වී දැනට ඉන්දුනීසියාවේ පවතින ශිල්පීය සංගීතය ……………………………………නමින් හැඳින්වේ. එය ප්‍රචලිත වීමට ඉවහල්වූ මානව සංගීත පර්යේෂණ සිදු කළ එක් සංගීත විද්‍යඥයෙකි. 40. …………………..……

41. ආලාප ප්‍රභේදයන්හි උච්ජ ස්වර බහුලව ඇසුරු කරනුයේ ………………………………… ආලාප තුළදිය.

42. චතුර්වේදය අතරින් වේද ගීතිකා ගායනා කරනු ලබන ක්‍රමවේදය දැක්වෙනුයේ කුමන වේද යේද? ……………………………………………………………………..

43. “ මනුෂ්‍ය බුද්ධිය අතිශයින් පුළුල් වූ බොහෝ සෙයින් පොදුවේ පැතිර ගිය නිපුණතා සමූහයකින් සමන්විතය දැනට ඉන් 8ක් මම ගණනය කළෙමි. තව බොහෝ තිබිය හැකිය.“ මෙසේ ප්‍රකාශ කර ඇත්තේ කවුරුන්ද ? …………………………………………………

44. C Major added 9th chord එකට අයත් ස්වර ලියා දක්වන්න.

………………………………………………………………………………………..

45. මහනුවර යුගයේ ආරම්භක හටන් කාව්‍ය ලෙස සැලකෙන “කොන්ස්තන්තීනු හටන“ කාගේ රචනයක් ද? ……………………………………………………………………..

46. “මුද්‍රප්පදය“ නම් සුවිශේෂී කොටසක් යෙදෙන ගීත ශෛලිය වන්නේ

…………………………………………………………………………….. ශෛලියයි.

47. සංධිවනි ආකෘතිය අනුගමනය කරමින් ගොඩනැගූ “මහාභිනිෂ්ක්‍රමණය“ කාගේ නිර්මාණයක් ද?

……………………………………………………………………………………………………..

48. උස්තාද් අෆාක් හුසේන් ඛාන් ප්‍රගුණ කළ වාද්‍ය භාණ්ඩය කුමක් ද? ………………………..

49. “ පාට වරුණ පුත පරමණ්ඩල පුත“ කුමන රංග ශෛලියේ ගීයක් ද? ……………………

50. උත්තර භාරතිය තරාණා ගායන ශෛලියට සමාන කර්ණාටක ගායන ශෛලිය කුමක් ද?

……………………………………………………………………………………………………..